# හෝමාගම අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2015

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1

10 ශ්‍රේණිය

කාලය පැය 01

නම/විභාග අංකය - ............. ..................................................................

**සැලකිය යුතුයි:**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා **යටින් ඉරක් අඳින්න.**

---

01 ව්‍යාපාර මිනිසාට වඩාත් වැදගත් වන්නේ,

(1) මිනිසාගේ ජීවන පැවැත්ම ක්‍රමයෙන් වෙනස් වන බැවිනි.
(2) ව්‍යාපාර මිනිසාට අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කරන බැවිනි.
(3) නිෂ්පාදනය සඳහා ව්‍යාපාර සම්පත් භාවිත කරන බැවිනි.
(4) මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා ව්‍යාපාර විසින් සපුරාලන බැවිනි.

02 භාණ්ඩ හුවමාරු ක්‍රමය හෙවත් බාටර් ක්‍රමය ( Bartar system ) ඇති වූයේ ,

(1) ස්වයං නිෂ්පාදනය නිසයි. (2) වක්‍ර නිෂ්පාදනය නිසයි.
(3) භාණ්ඩ අතිරික්තය නිසයි . (4) ඉහත සියල්ල නිසයි.

03 ජීවත්වීමේ දී සැමට ම පොදු වන්නා වූත් , අත්‍යවශ්‍ය වන්නා වූත්, සීමිත වන්නා වූත් ලක්ෂණ දක්නට ඇත්තේ.

(1) භාණ්ඩවල ය. (2) සේවාවල ය. (3) වුවමනාවල ය. (4) අවශ්‍යතාවල ය.

04 ඕනෑම ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නේ,

(1) නිෂ්පාදනය පෙරදැරි කරගෙන ය. (2) අලෙවිය පෙරදැරි කරගෙන ය.
(3) අරමුණු පෙරදැරි කරගෙන ය. (4) ලාභය පෙරදැරි කරගෙන ය.

05 සේවා නිෂ්පාදන පමණක් ඇති පිළිතුර තෝරන්න.

(1) පාන් , බැංකු, ටයර් , තේ (2) බැංකු , ගරාජ , ඇඳුම් , පාවහන්
(3) රෝහල් , බැංකු , තැපැල් , ගරාජ (4) ගරාජ , පාන්, ඇඳුම් , පාවහන්

06 ඕනෑ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා විවිධ සම්පත් අවශ්‍ය වේ. ඒවා හැඳින්වෙන්නේ,

(1) ප්‍රාග්ධනය ලෙසයි . (2) ව්‍යාපාර සාධක ලෙසයි.
(3) නිෂ්පාදන සාධක ලෙසයි. (4) ව්‍යවසාය ලෙසයි .

07 නිෂ්පාදනයේ දී, ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත් හැඳින්වෙන්නේ,

(1) නිෂ්පාදන සාධක ලෙසයි. (2) ප්‍රාග්ධනය ලෙසයි.
(3) ව්‍යවසාය ලෙසයි. (4) භූමිය ලෙසයි.

08 පහත **A** තීරුවේ ඇල්මැති පාර්ශවයන් ද , **B** තීරුවේ ව්‍යාපාර සඳහා ඔවුන්ගේ දායකත්වය ද දක්වා ඇත.

| | **A** | | **B** |
|---|---|---|---|
| 1 | අයිතිකරුවන් | a | ප්‍රතිපත්ති සම්පාදනය කරයි. |
| 2 | කළමනාකරුවන් | b | පරිභෝජනය කරයි. |
| 3 | සේවකයන් | c | සම්පත් සපයයි. |
| 4 | ගනුදෙනුකරුවන් | d | තීරණ ක්‍රියාත්මක කරයි. |
| 5 | රජය | e | කාර්යයන් ඉටු කරයි. |

ඉහත **A** සහ **B** තීරුවේ තොරතුරු නිවැරදි ව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(1) 1 - a , 2 - d , 3 - e , 4 - b , 5 - c (2) 1 - d , 2- c , 3 - e , 4 - d , 5 - b
(3) 1 - c , 2 - d, 3 - e , 4 - b , 5 - a (4) 1 - c , 2 -b , 3 - d, 4 - a , 5 - e

09 බදු ආදායම් නිසි ලෙස ලබා ගැනීම , රැකියා අවස්ථා උත්පාදනය කිරීම හා ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීම යන අරමුණු සහිත ව ව්‍යාපාර පිළිබඳ ව ඇල්මක් දක්වන්නේ,

(1) අයිතිකරුවන් ය. (2) ප්‍රජාව ය. (3) රජය ය . (4) තරගකරුවන් ය.

10 ව්‍යාපාර ප්‍රවනතා හඳුනා ගනිමින් නව ව්‍යාපාර අවස්ථා උදා කර ගැනීමට නම්, වඩාත් ම අවධානය යොමු කළ යුතු වන්නේ ,

(1) ව්‍යාපාරයක අරමුණු කෙරෙහි ය. (2) ව්‍යාපාර පරිසරය කෙරෙහි ය.
(3) ඇල්මැති පාර්ශවයන් කෙරෙහි ය. (4) ව්‍යාපාර නිෂ්පාදිතය කෙරෙහි ය.

11 ව්‍යාපාර සඳහා අවශ්‍ය විදුලිය සැපයීම, මහාමාර්ග තැනීම, ජලය ලබා දීම සහ භූමිය සංවර්ධනය කිරීම යනා දී කටයතු හැඳින්වෙන්නේ, ව්‍යාපාරයකට අවශ්‍ය,

(1) පරිසර සාධක ලෙසයි. (2) අත්‍යවශ්‍ය සේවා ලෙසයි .
(3) යටිතල පහසුකම් ලෙසයි . (4) රජයේ ආධාර ලෙසයි.

12 ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම විවිධාකාර ය. සේවක සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා රජය විසින් ඉටු කරනු ලබන කටයුත්තකි,

(1) බලපත්‍ර ලබා දීම. (2) ව්‍යාපාර ලියාපදිංචි කිරීම.
(3) සේවා කාලය තීරණය කිරීම. (4) පාරිභෝගික ආරක්ෂක නීති පැනවීම.

13 ආර්ථික පරිසරයට අදාළ විචල්‍යයන් පමණක් ඇති පිළිතුර, දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

(1) පාරිභෝගික ආරක්ෂාව, නව සොයා ගැනීම් , වැටුප් හා ආදායම
(2) වැටුප් , ආදායම්, ඉතිරිකිරීම් , බදු
(3) ආයෝජන , නීතිරීති , යටිතල පහසුකම්, හා වැටුප්
(4) නව ක්‍රමවේද, නව සොයා ගැනීම්, ආයෝජන, ඉතිරිකිරීම්

14 තාක්ෂණික පරිසරයේ වෙනස්වීම් හේතුවෙන් ව්‍යාපාරවලට සිදු වන අයහපත් බලපෑමකි,

(1) නිමැවුමේ ගුණත්වය ඉහළ යාම (2) නිෂ්පාදනය කාර්යක්ෂම වීම
(3) යන්ත්‍ර සූත්‍ර යල් පැනීම (4) වෙළෙඳාම වැඩි දියුනු වීම

15 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව, ප්‍රවාහන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් ඇති වී ඇති පාරිසරික බලපෑම් හැඳින්වෙන්නේ,

(1) ගෝලීය පරිසරය ලෙසයි. (2) ස්වාභාවික පරිසරය ලෙසයි.
(3) ආර්ථික පරිසරය ලෙසයි. (4) නෛතික පරිසරය ලෙසයි.

16 රාජ්‍ය (පොදු ) අංශයේ, ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි,
(1 ) තනි පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර (3) සීමිත සමාගම් (4) රාජ්‍ය සමාගම්

17 ව්‍යාපාර සංවිධානයක පරිමාණය විවිධ නිර්ණායක මත තීරණය කරනු ලබයි. එහි දී සලකා බැලෙන ප්‍රමාණාත්මක නිර්ණායකයකි,
(1 ) යොදවා ඇති ප්‍රාග්ධනය (2 ) භාවිත කරන තාක්ෂණය
(3) ව්‍යාපාර සංවිධාන ක්‍රමය (4 ) වෙළෙඳපොළ ස්වභාවය

18 සුලලිත නිතරම නිදහස් ව සිතන තම අභිමතය පරිදි ම කටයුතු කරන අයෙකි. තමාගේ සියලු කටයුතු කැපවීමෙන් මෙන් ම උනන්දුවෙන් කිරීමට ඔහු හැමවිටම වග බලා ගනියි. සුලලිත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි නම් ඔහුට වඩාත් ගැළපේ යැයි සිතිය හැකි ව්‍යාපාර සංවිධානය කුමක් ද ?
(1 ) තනි පුද්ගල ව්‍යාපාර (2 ) හවුල් ව්‍යාපාර (3 ) සමිති (4) සමාගම්

- 17 සහ 18 යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු උපයෝගී කර ගන්න.
A - තනි පුද්ගල ව්‍යාපාර B - හවුල් ව්‍යාපාර C - සීමිත සමාගම් D - සමූපාකාර
E - රාජ්‍ය සංස්ථා F - දෙපාර්තමේන්තු

19 ඉහතු ව්‍යාපාර සංවිධාන අතුරින් නෛතික පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධාන වන්නේ,
(1) A, D, E (2 ) A, B, F (3) C, D, E (4) B, D, E

20 අසීමිත වගකීමක් සහිත ව්‍යාපාර සංවිධාන වන්නේ,
(1 ) C, D, E, F (2 ) A, B, E, F (3 ) A, B, C, F (4) B, D, E, F

21 හවුල් ව්‍යාපාරයක් ලිඛිත ගිවිසුමක් යටතේ ඇරඹිය යුතු යැයි ප්‍රකාශිත නීතිය වන්නේ,
(1) ව්‍යාපාර නාම ආඥා පනත (2) වංචා වැලැක්වීමේ ආඥා පනත
(3) 2007 අංක 7 දරණ සමාගම් පනත (4) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

22 හවුල් ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව තීරණය කෙරෙන නීතිය වන්නේ,
(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත (2) 2007 අංක 7 දරණ සමාගම් පනත
(3) 1972 අංක 5 දරණ සමූපකාර පනත (4) වංචා වැලැක්වීමේ ආඥා පනත

23 පූර්ණ අයිතිය රජය සතුවන හෝ අයිතියෙන් වැඩි ප්‍රමාණයක් රජය සතුවන හෝ ව්‍යාපාරයකි,
(1) හවුල් ව්‍යාපාර (2) සංස්ථාපිත සමාගම් (3) සමූපකාර (4) රාජ්‍ය සංස්ථා

24 පෞද්ගලික අංශයට අයත් වුව ද රාජ්‍ය අනුග්‍රහය ලබන ව්‍යාපාර සංවිධානයකි,
(1) තනි පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර (3) සංස්ථාපිත සමාගම් (4) සමූපකාර

25 ව්‍යාපාරයක් තෝරා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් සැලකිලිමත්වන සාධක තුනක් වන්නේ අරමුණ, කළමනාකරණය හා --------------
(1) පරිමාණය යි. (2) දැක්ම යි. (3) සම්පත් ප්‍රමාණය යි. (4) වෙළෙඳපොළ යි

26 ගිණුම්කරණයේ අරමුණ වන්නේ,
(1) ව්‍යාපාරික ගනුදෙනු වාර්තා කිරීම ය. (2) ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම ය.
(3) මූල්‍ය වාර්තා පිළියෙල කිරීම ය. (4) ඇල්මැති පාර්ශවයන්ට තොරතුරු සැපයීම ය.

27 ව්‍යාපාරයක සිදු වූ අතීත ගනුදෙනුවක ප්‍රතිඵල ලෙස බිහිවන, ව්‍යාපාරයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන, ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් ගිණුම්කරණයේ දී හැඳින්වෙන්නේ,
(1) වත්කම් ලෙස ය. (2) දේපල ලෙස ය. (3) ආදායම් ලෙස ය. (4) ප්‍රතිලාභ ලෙස ය.

28 ව්‍යාපාරයක හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය නිවැරදි ව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) ආදායම් — වියදම් (2) වත්කම් — වගකීම්
(3) ජංගම වත්කම් + ජංගම නොවන වත්කම් (4) වගකීම් + වත්කම්

29 රෙදිපිළි අලෙවි කිරීමේ ව්‍යාපාරයක ණය පදනම මත ගත් රෙදිපිළි සඳහා ගෙවිය යුතු මුදල,
(1) ජංගම වත්කමකි. (2) ජංගම නොවන වත්කමකි.
(3) ජංගම වගකීමකි. (4) ජංගම නොවන වගකීමකි.

30 සඳුන් තමා සතු රු. 50, 000 ක මුදල ද, බැංකුවෙන් ලබාගත් රු. 25, 000 ක ණය මුදල ද යොදා 2015 - 01 - 01 දින ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. 2015 - 01 - 01 දිනට එම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වන්නේ,
(1) වත්කම් + ප්‍රාග්ධනය = වගකීම්
රු.75, 000 + රු.50, 000 = රු. 25, 000
(2) ප්‍රාග්ධනය + වගකීම් = වත්කම්
රු.75,000 + රු.25, 000 = රු.100, 000
(3) වගකීම් + ප්‍රාග්ධනය = වත්කම්
රු. 25, 000 + රු.50, 000 = රු.75,000
(4) වත්කම් + වගකීම් = ප්‍රාග්ධනය
රු.75,000 + රු.25, 000 = රු.100, 000

31 ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාමේ දී ආදායම් ඉපයීමට දායක වූ වටිනාකම හැඳින්වෙන්නේ,
(1) ආදායම ලෙසයි (2) වියදම ලෙසයි (3) හිමිකම ලෙසයි (4) වත්කම් ලෙසයි

32 ව්‍යාපාරයක හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනු ව තෝරන්න.
(1) විදුලි වියදම රු. 2 000 (2) ගැනිලි රු.1 500
(3) ලැබූ කොමිස් රු. 4 500 (4) ණය පොලී ගෙවීම රු. 1 200

33 ව්‍යාපාරයකට අයිතිකරු පමණක් සම්පත් යොදා ඇති විට ගිණුම්කරණ සමීකරණය වන්නේ,
(1) වත්කම් = හිමිකම් (2) වත්කම් + වගකීම් = හිමිකම්
(3) වත්කම් = ප්‍රාග්ධනය + වගකීම් (4) ප්‍රාග්ධනය + වත්කම් = වගකීම්

34 අමල් පෙරේරා ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. ඔහුට ලොතරැයි දිනුමකින් රු. 15 000 ක් ලැබුණි. ඔහු එම මුදල ද සිය ව්‍යාපාරයට යෙදවී ය. එමනිසා ඔහුගේ ව්‍යාපාරයේ ,
(1) වත්කම් හා හිමිකම් වැඩි වේ. (2) වත්කම් හා හිමිකම් අඩු වේ.
(3) වත්කම් වැඩි වී, හිමිකම් අඩු වේ. (4) වත්කම් අඩු වී, හිමිකම් වැඩි වේ.

35 ඉහත සඳහන් ව්‍යාපාරයේ අමල් පෙරේරා සිය ව්‍යාපාරයට රු. 25 000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදී. ඒ නිසා ව්‍යාපාරයේ,
(1) වත්කම් වැඩි වී ප්‍රාග්ධනය වැඩි වේ. (2) වත්කම් වැඩි වී වගකීම් වැඩි වේ.
(3) වගකීම් වැඩි වී ප්‍රාග්ධනය වැඩි වේ. (4) ප්‍රාග්ධනය වැඩි වී වගකීම් අඩු වේ.

36 ගිණුම්කරණ කාලච්ඡේදය තුළ දී ආදායම බිහි කරලීමට දායක වූ වියදම් මුදලින් ගෙවූ විට,
(1) වත්කම් අඩු වී ප්‍රාග්ධනය අඩු වේ. (2) වත්කම් අඩු වී ප්‍රාග්ධනය වැඩි වේ.
(3) වත්කම් වැඩි වී ප්‍රාග්ධනය අඩු වේ. (4) ඉහත කිසිවක් සිදු නො වේ.

37 අයිතිකරු සිය පෞද්ගලික ප්‍රයෝජනයට තමාගේ ව්‍යාපාරයෙන් රු. 5 000ක භාණ්ඩ ගැනීම හේතුවෙන්, එම ව්‍යාපාරයේ,

(1) වත්කම් අඩු වී , හිමිකම් වැඩි වේ.
(2) වත්කම් අඩු වී , හිමිකම් අඩු වේ.
(3) වත්කම් වැඩි වී, හිමිකම් අඩු වේ.
(4) වත්කම් හා හිමිකම් වැඩි වේ.

38 ව්‍යාපාරයක් නැවත විකිණීම සඳහා රු. 15 000 ක භාණ්ඩ තොගයක් මුදලට ගැනීම, ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයේ දැක්වෙන්නේ,

(1) තොගය - රු. 15 000 = මුදල් - රු.15 000
(2) තොගය + රු. 15 000 = මුදල් - රු. 15 000
(3) තොගය + රු. 15 000 = මුදල් + රු. 15 000
(4) තොගය + රු. 30 000 = මුදල් - රු. 30 000

39 ගැනිලි හැරුනු විට හිමිකම අඩු වීමට බලපාන්නේ,

(1) ආදායම් ය.
(2) වියදම් ය.
(3) වත්කම් ය.
(4) වගකීම් ය.

40 වැඩි වීම 'හර' අඩු වීම 'බැර' යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ ,

(1) වත්කම් හා වගකීම් ගිණුම්වලට ය.
(2) වගකීම් හා හිමිකම් ගිණුම්වලට ය.
(3) වියදම් හා ආදායම් ගිණුම්වලට ය.
(4) වත්කම් හා වියදම් ගිණුම්වලට ය.

The National e-Learning Portal for The General Education